හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අවශ්‍ය භාණ්ඩ , වැඩ සහ උපදේශනාත්මක නොවන සේවා සඳහා ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙතින් හම්බන්තොට දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ලියාපදිංචි කිරීමේ ක්ෂේත්‍රය (අයිතමය) සහ අයදුම්පත හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් පිටුව වන www.hambantota.dist.gov.lk හි බාගත කිරීම් (download) යටතේ වන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ විස්තරය (Supply registration Details) වෙත පිවිස බාගත කළ හැකිය.

ඒ අනුව පහත උපදෙස් හා කොන්දේසිවලට යටත්ව අයදුම්පත් සම්පූර්ණ කර 2026.12.18 දිනට පෙර " **දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් ගිණුම් අංශයේ ප්‍රසම්පාදන ඒකකයට බාර දිය හැක.

01. <u>කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම</u>

සුදුසුකම් හා සැපයිය යුතු ලේඛන

අ) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ කොන්ත්‍රාත් ව්‍යාපෘති සිදු කිරීමට හැකියාවක් හා කැමැත්තක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි විය හැකි අතර " **සෑම කොන්ත්‍රාත්කරුවකුම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)"** ආයතනයේ වලංගු ලියාපදිංචියක් සහිත විය යුතුය. ලංසු අයදුම්පත සමඟ අදාළ **CIDA** ලියාපදිංචි සහතිකයේ පැහැදිළි පිටපතක් සහ **ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ** පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

02. <u>සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම</u>

සුදුසුකම් හා සැපයිය යුතු ලේඛන

අ) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත
ආ) ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු විශේෂ බලපත්‍රය හෝ අවසර පත්‍රය
ඇ) සේවා නියෝජිත / අලෙවි නියෝජිත / බලයලත් නියෝජිත ආයතනයක් බවට වන ලිපි (ඇත්නම් පමණි - සැපයුම් කිරීමට අපේක්ෂිත භාණ්ඩ සඳහා පමණි)
ඉ) ආපනශාලා සම්බන්ධයෙන් නම් මහජන සෞඛ්‍ය පරීක්ෂණක /සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගේ සහතිකය
ඊ) වැට් (VAT) ලියාපදිංචි කිරීමේ සහතිකය

ලියාපදිංචි කිරීමේදී අයදුම් කිරීමට අපේක්ෂිත අයිතමය අනුව අත්‍යවශ්‍ය ලේඛන / සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

03. **විශේෂ උපදෙස්**

2027 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අවශ්‍ය භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා ලියාපදිංචි වන සැපයුම්කරුවන්ගෙන් හා

කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු ආරාධනා සිදු කරනු ලබන බැවින් අදාළ අයදුම්පත් නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

04. අයදුම් කිරීම හා ලියාපදිංචි වීම සඳහා උපදෙස්

I. ලියාපදිංචි කිරීම 2026.11.02 දින සිට 2026.12.18 දක්වා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් ලියාපදිංචි කරනු ලබන අතර, ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් පිටුව වන www.hambantota.dist.gov.lk හි බාගත කිරීම් (download) යටතේ වන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ විස්තර (Supply registration Details) යට පිවිස බාගත කර ගත් අයදුම්පත සම්පූර්ණ කර යොමු කළ යුතුය.

II. ඉහත නිල වෙබ් පිටුවට ඇතුළත් කර ඇති අයිතම ලයිස්තුවේ සඳහන් අයිතමයන් වෙනුවෙන් ලියාපදිංචි විය හැකි අතර, එක් අයිතමයක් සඳහා රු. 750.00 ක ගාස්තුවක් අයකරනු ලැබේ. අයදුම්පත මඟින් ඉල්ලුම් කරනු ලබන අයිතමයන් වෙනුවෙන් සම්පූර්ණ ලියාපදිංචි කිරීමේ ගාස්තුව ‘‘දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට‘‘ නමින් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත ගෙවීම් කර ලැබෙන ලදුපත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. නැතහොත් අදාළ ලියාපදිංචි ගාස්තුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් නමින් මුදල් ඇණවුමක් වශයෙන් හෝ Govpay හරහා ගෙවිය හැක.

III. අදාළ ලියාපදිංචි ගාස්තුව රහිතව හෝ නියමිත අගයට අඩුවෙන් ඉදිරිපත් කර ඇති අයදුම්පත් ලියාපදංචිය සඳහා බාර නොගන්නා අතර, ඒ සඳහා දරණ ලද මුදල් ප්‍රතිපූර්ණය නොකරනු ලැබේ.

IV. අයදුම්පත්‍ර යෙහි * ලකුණ යොදා ඇති විස්තරය අයදුම්කරු විසින් අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු අතර, අයදුම්පත පැහැදිළි අත් අකුරින් හෝ මුද්‍රණය කොට ඉදිරිපත් කළ යුතුවේ. ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය හා විද්‍යුත් ලිපිනය පැහැදිළිව සම්පූර්ණ කළ යුතුය.

V. වැඩ කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වන සැපයුම්කරුවන් CIDA ලියාපදිංචි සභතියේ C ශ්‍රේණිය පැහැදිලිව හඳුනාගත හැකිවන පරිදි ඡායාපිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, CIDA සභතිකය නොමැතිව කොන්ත්‍රාත් සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් CIDA ලියාපදිංචියක් රහිත අයදුම්කරුවන් යටතේ ඇතුළත් කරනු ලැබේ.

05. වෙනත් කොන්දේසි:

01. සියලුම අයදුම්පත් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කමිටු විසින් සලකා බලන අතර, සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් වෙත ඇති හැකියාවන් සහ සුදුසුකම් මත ලියාපදිංචි කිරීමේ හැකියාව සහ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය එම කමිටු නිර්දේශය මත හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් සතුවේ.

02. යම් සැපයුම්කරුවකුගේ හෝ කොන්ත්‍රාත්කරුවකුගේ සේවය සැපයීම පිළිගත නොහැකි මට්ටමට දුර්වල තත්ත්වයක පවතීනම් හෝ සැපයුම/කොන්ත්‍රාත් කටයුතු කිරීමේ දී යම් වංචාසහගත ක්‍රියාවක් හෝ අක්‍රමිකතාවයක යෙදුනු බවට තහවුරු වුවහොත් එම සැපයුම්කරුගේ/කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිය අවලංගු කිරීමට දිස්ත්‍රික් ලේකම්ට පූර්ණ අයිතියක් ඇත.

03. සියලුම අයදුම්කරුවන් සුදුසුකම් , හැකියාවන් හා යොග්‍යතාවයන් සපුරා ඇතැයි යන උපකල්පනය මත ලියාපදිංචිය සිදුකරනු ලබන අතර, එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලියන්හිදී එම විශේෂ ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් සපුරා නොමැති සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
04. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ලංසු යෝජනා/ මිල ගණන් කැඳවීම ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සිදු කරනු ලබන අතර, අවශ්‍යතාවය පරිදි ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු යෝජනා/මිල ගණන් කැඳවීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුවේ.
05. ලංසු යෝජනා/ මිලගණන් කැඳවීමේ දී සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් අනුයාත අවස්ථා තුනක දී (03) ප්‍රතිචාර නොදක් වන්නේ නම් ඉදිරි ලංසු කැඳවීම් යොමු නොකිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වයට පූර්ණ අයිතියක් ඇත.
06. ඉදිරියේ දී මිල ගණන් කැඳවීම විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය (E-GP) අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බැවින් සියලුම සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 08/2019 පරිදි රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ (promise.lk) ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා www.promise.lk වෙත පිවිස ලියාපදිංචි විය හැක.
07. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනෙන් පසුව ලැබෙන, එනම් ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ලියාපදිංචි කිරීමේ දී එක් අයිතමයකට ලියාපදිංචි වීමේ ගාස්තුව ලෙස රු.1,000.00 ක මුදලක් අයකරනු ලැබේ.
08. ලියාපදිංචි කිරීමේ කටයුතු සම්බන්ධයෙන් යම් පැහැදිළි කිරීමක් වෙතොත් 047-2256139 දුරකථන අංකය ඇමතීමෙන් තොරතුරු ලබා ගත හැක.

සභාපති

දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය